# ශ්‍රී ලංකාවේ බෞද්ධ ජනතාව දේශජ දෙවියෙකු ලෙස සලකන ඉන්දික දේව සංකල්පය පිළිබඳ අධ්‍යයනයක්

කේ. එස්. කොඩිකාර[1]

## හැඳින්වීම

ශ්‍රී ලංකාව බෞද්ධ රාජ්‍යයක් බවට පත්වන්නේ බුදුන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනයත් සමග ය. එහිදී බුදුන් වහන්සේ වැඩම කළ ස්ථානය වන්නේ මහියංගණය නම් ස්ථානයේ යක්ෂයින් දමනය කිරීමෙන් අනතුරුව යක්ෂ සේනා සමූහයා දිවයිනේ උතුරු දෙසට පළායයි. මෙහිදී බුදුන් වහන්සේගේ ධර්මදේශනා මෙම ස්ථානයේ සිදුකොට බෞද්ධ ජන සමූහයක් ඇති කිරීමට කටයුතු සම්පාදනය කරන්නට විය. මෙම කටයුත්ත සඳහා දෙවිවරුන්ගේ අනුග්‍රහකත්වය ද හිමි විය. එහිදී සුමන සමන් දිව්‍යරාජයාගේ මූලිකත්වයෙන් සෙසු දේව මණ්ඩලය ද උපකාරී විය. ශ්‍රී ලංකාව තුළ බෞද්ධාගම ව්‍යාප්ත කිරීම සඳහා පළාත් භාර දෙවිවරු, ප්‍රදේශීය දෙවිවරුන් ඇතුළු දේව ප්‍රජාව කටයුතු කරන්නට විය. එහිදී තම ප්‍රදේශවල බුදුදහම ව්‍යාප්ත කිරීම, ඒ සඳහා ස්ථාන පූජා කිරීම හඳුනාගත හැකිය.

මෙම දෙවියන් බුදුදහම ව්‍යාප්ත කිරීමට කටයුතු කරන්නේ බුදුන් වහන්සේට සිය ප්‍රදේශයට වැඩම කිරීමට ආරාධනා කිරීමෙන් අනතුරුව ය. එහිදී බුදුන් වහන්සේගේ ගිමන් නිවාලූ මෙම ස්ථානයේදී බුදුන්ගේ ශරීරයෙන් නිකුත් වූ දහඩිය මුතු ඇට බවට පත් වූ ආකාරය ජනප්‍රවාදයේ සඳහන් වේ. එහිදී බුදුන්ගේ ශරීරයෙන් නිකුත් වූ දහඩිය හේතුවෙන් මුතු අංගණ පසුව මුතියංගණ බවට පත්වි ය. මෙසේ බුදුන් වහන්සේගේ පාද ස්පර්ශය ලත් මෙම ස්ථානය පසුකාලීනව සොළොස්මස් ස්ථානයක් බවට පත් වේ.

## පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලංකාවේ බෞද්ධ ජනතාව දේශජ දෙවියෙකු ලෙස සලකන ඉන්දික දෙවියන්ට ලාංකේය සමාජය තුළ හිමිවන ස්ථානය කුමක්ද? බෞද්ධ ධර්මයෙහි ව්‍යාප්තියට දායකත්වය සපයන දෙවිවරයෙකු වශයෙන් කටයුතු කිරීම කුමන ආකාරයට සිදු වූයේද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ ය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ප්‍රධාන පර්යේෂණ ක්‍රම උපයුක්ත කර ගන්නා ලදි. එනම් සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය සමීක්ෂණයයි. මෙහිදී

---

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර, kodikasun99@gmail.com

මූලාශ්‍ර අධ්‍යයනය මගින් ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍ර යොදා ගනු ලබන්නේ ය. මීට අමතරව සහභාගි නිරීක්ෂණ ක්‍රමවේදය යොදාගන්නා ලදි. ප්‍රදේශයේ ජීවත්වන ජනයා හමු වී ලබාගත් තොරතුරු පාදක කොටගනිමින් මෙම පර්යේෂණය සිදුකරන ලදි.

## ප්‍රතිඵල

බුදුන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනයට සමගාමීව ශ්‍රී ලංකාවේ දෙවිවරුන් අතුරින් ප්‍රදේශීය දෙවිවරයෙකු වශයෙන් ඉන්දික දෙවියන්ට අන්‍ය දෙවිවරුන්ට වඩා සුවිශේෂී ස්ථානයක් හිමිවේ. ශ්‍රී ලංකාවේ ප්‍රදේශීය දෙවිවරුන් වැඩ වාසය කරන ස්ථානය හා ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය දැකිය හැකි වන්නේ බෞද්ධ පූජනීය ස්ථානවල නොවේ. නමුත් සුමන සමන් දිව්‍ය රාජයා හැරුණු විට එම ස්ථානය හිමිවන එක ම දිව්‍ය රාජයා වන්නේ ඉන්දික දෙවියන් ය. ඉන්දික දෙවියන්ගේ වාස භූමිය වන්නේ නමුණුකුල කඳු වැටි යයි. එහෙත් බදුල්ල ප්‍රදේශයේ ඓතිහාසික සිද්ධස්ථානයක් වන මුතියංගණ රජමහා විහාරයේ බුදු දහම සුරක්ෂිත කිරීමට හා ධර්මය ව්‍යාප්ත කිරීම සඳහා ඉන්දික දෙවියන්ට වගකීමක් ලබා දී ඇත.

මෙම ඉන්දික දේව සංකල්පය හඳුනාගැනිමේදි පෙනී යනු ලබන කාරණාවක් වන්නේ ශ්‍රී ලංකාවේ දේව සංකල්පය ගත් විටදි හින්දු මුහුණුවරකට වඩා බෞද්ධ සභ්‍යත්වයක් දැකිය හැකි බවයි. නමුත් මෙම ඉන්දික දෙවියන් පිළිබඳ අධ්‍යයනය කිරීමේදි දැකිය හැකි ප්‍රධානත ම කරුණක් වන්නේ දෙවියන් වන්දනා කිරීමේදී බෞද්ධ ජනතාවට පමණක් සීමා විමයි. එහිදී මෙම දෙවියන් වන්දනා කරන ජනතාව බෞද්ධ මුහුණුවරකට අනුව මෙම දෙවියන් වන්දනා කිරීමක් සිදු කරනු ලබන්නේ ය. එහිදී බෝධි පූජා පිංකම් මාලාවේදී මිනිසුන්ගේ අධ්‍යාත්මික සුවය උදෙසා ඉන්දික දෙවියන් ද ස්මරණය සිදු කරනු ලබන්නේ ය. මීට අමතරව වාර්ෂිකව ඉන්දික දෙවියන් වෙනුවෙන් සිදුකරනු ලබන පූජා චාරිත්‍රය ලාංකේය දෙවිවරුන් සඳහා ලබාදෙනු ලබන ආහාර පූජාවන්ට වඩා වෙනස් මුහුණුවරක් ගනු ලබන්නේ ය. ඉන්දික දෙවියන්ට ලබාදෙනු ලබන කිරිබත් මිශ්‍ර ආහාරය දෙවියන්ට පිළිගැන්වීමක් මෙහිදි සිදුකළද, ආහාරය ගැනීමේදී දෙවියන්ට වඩා මෙම කටයුත්තට සහභාගිවන බැතිමතුන් පිරිස නමුණුකුල කඳුවැටිය අභියසදි ආහාරයට ගත යුතු යන්න ජනප්‍රවාදයේ පවතී.

මෙම ප්‍රදේශයේ මිනිසුන්ට තම කෘෂිකාර්මික වගා සඳහා ජලය නොලැබෙන කාල වකවානුවේදී වැසි අපේක්ෂාවෙන් ඉන්දික දෙවියන් වැඩ වාසය කරන නමුණුකුල කඳුවැටිය අබියසට බදුල්ල ප්‍රදේශයේ වැඩ සිටින මහා සංඝරත්නය පෙරටු කොට ගෙන ගිහි පිරිස වැසි අපේක්ෂාවෙන් මෙම කටයුත්තට දායක විය. එම ස්ථානයේදී මහා සංඝරත්නය ආශිර්වාදය මැද පිරිත් දේශනාවක් සිදුකිරීමෙන් අනතුරුව වැසි පතිත වන බවට ජනප්‍රවාදයේ පවතී.

තම අපේක්ෂිත අරමුණු සාධනය කරගැනීම සඳහා ඉන්දික දෙවියන්ට බාරහාර වී ආශිර්වාද ලැබීමද ඌවේ ජනතාව තුළ පවති. එසේ බලාපොරොත්තු ඉටුවන ආකාරයක් ද දැකිය හැකිවේ. එවැනි කටයුතුවලදී බාරහාර ඉටු කිරීමේදී බෞද්ධ මුහුණුවරට සිදුවන්නේ ය. නෙළුම්මල් දහයේ සිට දහස දක්වා සංඛ්‍යාවලින් පූජා කිරීම ද, පහන් මගින් අලෝක පූජා සැපයීම ද ආදී කටයුතු සිදුකරනු ලබන්නේය. මෙහිදී ආශිර්වාද ලත් ප්‍රජාව බුදුන් වහන්සේගේ ධර්මය අනුගමනය කරමින් ඉන් අනතුරුව ඉන්දික දෙවියන්ට පිං අනුමෝදනා කරනු ලබන්නේය. මුතියංගණ ථූප වන්දනාවේදි දැක්වෙන පරිදි,

"ඉන්දික සිරි දෙවිඳු තෙද පැතිරණ තැනය
වන්දිත රැකෙන බබළන සුදු බුදු ගුණය
සිංහලයනට ජයදුන් වර අප මණය
සංසුන් සිතින් නමදිම් මුතියංගණය "

බෞද්ධ ධර්මය සම්බන්ධව මෙම දෙවියන් බුදුදහම ව්‍යාප්ත කිරීමට හා ශාසන සුරක්ෂිත භාවය උදෙසා කටයුතු කළ බවක් මෙම අධ්‍යයනය මගින් හඳුනාගත හැකිය.

**නිගමනය**

ශ්‍රී ලංකාවේ බෞද්ධ ජනතාව දේශජ දෙවියෙකු ලෙස සලකන ඉන්දික දේව සංකල්පය එක්තරා ප්‍රදේශයකට සීමාවීමක් බැවින් ලංකාවේ අනෙකුත් ප්‍රදේශවල බෞද්ධ ජනතාව තුළ මෙම දෙවියන් වන්දනා කිරීමක් සිදු නොවන්නේ ය. මෙම දෙවියන් බුදුන් වහන්සේගේ ලංකාගමනයේදී දක්වන ලද අනුග්‍රහය පිළිබඳ සමාජය තුළ එතරම් පුළුල් අවබෝධයක් නොමැත. එබැවින් මෙම දේව සංකල්පය ජාතික ඉතිහාසයට අප විසින් බද්ධ කළ යුතු වන්නේ ය.

**ප්‍රමුඛ පද** : මුතියංගණය, බුදුදහම, ඉන්දික දෙවියන්

**ආශ්‍රිත ග්‍රන්ථ**

**මහාවංසය**, (1959). (සංස්.) පොල්වත්තේ බුද්ධදත්ත හිමි. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

සූරියආරච්චි, ගාමිණි. (2013). *බදුලු අභිමන එකලු කළ මිණි*, මහරගම: තරංජි ප්‍රින්ටර්ස්.

පාලිත, ලක්ෂ්මන්, (2010). *අසිරිමත් ඌව පළාතේ සංචාරයක්.* මීරිගම: ආකර්ෂා ප්‍රකාශකයෝ.

උපාලි හිමි, වේඩරුවේ. *බදුළු මුතියංගණ.* රාජගිරිය: ගොල්ඩන් ග්‍රැෆික්ස්.

වජිරප්‍රඥ හිමි, මඩවල. (2007). *දේව පුරාණය සමන් දෙවිඳු හා සමන් දෙවොල.* දෙහිවල: ශ්‍රී දේවි ප්‍රින්ටර්ස්.